ET/SSS/2022(2023)/OL/62/S/Q/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Civic Education

# පුරවැසි අධ්‍යාපනය



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

**දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 62 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| குடிமை கல்வி | I, II |
| Civic Education | I, II |

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමය යි. මෙම ප්‍රකාශය හා සම්බන්ධ චින්තකයා වන්නේ,

   (1) සීලර් ය. (2) ඒබ්‍රහම් ලින්කන් ය. (3) ජේ. ආර්. ලවල් ය. (4) ඇරිස්ටෝටල් ය.

2. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය යන නිෂ්පාදන සාධකවලට කරන ගෙවීම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

   (1) බදුකුලී, වැටුප්, පොලිය හා ලාභය (2) වැටුප්, පොලිය, බදුකුලී හා ලාභාංශ

   (3) ලාභාංශ, බදුකුලී, පොලිය හා වැටුප් (4) ලාභාංශ, වැටුප්, බදුකුලිය හා පොලිය

3. ගැටුම් නිරාකරණයේ දී "ජය - ජය" විසඳුම් ලබා ගැනීමට යොදා ගත හැකි පහසු ම ක්‍රමවේදය වන්නේ,

   (1) කේවල් ක්‍රමය යි. (2) සාකච්ඡා ක්‍රමය යි.

   (3) සහමන්ත්‍රණය යි. (4) මැදිහත්කරණය යි.

4. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකුගේ වගකීමක් වන්නේ,

   (1) තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීම යි.

   (2) විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්වීමට කටයුතු කිරීම යි.

   (3) සියලු ම සංස්කෘතීන්ට ගරු කරමින් සමාන ව සැලකීම යි.

   (4) කිසිදු සංස්කෘතියකට ගරු නොකිරීම යි.

5. පුරවැසියාගේ බාහිර හැසිරීම පාලනය කිරීම සඳහා රජය විසින් හෝ අධිකාරී බලය සහිත ආයතනයක් විසින් හෝ පනවන ලද රෙගුලාසි මාලාව වන්නේ,

(1) නීතිය යි. (2) ආචාර ධර්ම යි. (3) රෙගුලාසි වේ. (4) යුක්තිය යි.

6. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට අයත් වන නීතිමය ලේඛන සංඛ්‍යාව,

(1) 3කි. (2) 4කි. (3) 5කි. (4) 6කි.

7. වායු දූෂණය සිදු වන ස්වාභාවික ක්‍රමයක් වන්නේ මින් කුමක් ද?

(1) ගිනි කඳු පිපිරීම (2) කර්මාන්තශාලා

(3) ප්‍රවාහන කටයුතු (4) වනාන්තර විනාශ කිරීම

8. සාධාරණ හැසිරීම හෝ සාධාරණ සැලකීම නැතහොත් අපක්ෂපාතී ව ක්‍රියා කිරීම,

(1) නීතිය යි. (2) යුක්තිය යි.

(3) සාධාරණත්වය යි. (4) නිර්භීතකම යි.

9. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා යම්කිසි මිලක් ගෙවා ලබා ගන්නා භාණ්ඩ,

(1) අන්තර් භාණ්ඩ වේ. (2) ආර්ථික භාණ්ඩ වේ.

(3) ප්‍රාග්ධන භාණ්ඩ වේ. (4) නිෂ්පාදන භාණ්ඩ වේ.

10. යුධමය අරමුණු මත පිහිටුවා ගන්නා ලද කලාපීය සංවිධානයක් වන්නේ මින් කුමක් ද?

(1) ආසියාන් (2) නේටෝ (3) සාර්ක් (4) බිම්ස්ටෙක්

11. නීතියේ ආධිපත්‍යය යන්නට වඩාත් ගැළපෙන්නේ මින් කවර පිළිතුර ද?

(1) සමාජයේ ප්‍රභූ ස්තර පාලනය කිරීම යි.

(2) උසස් ආයතනවල ක්‍රියාකාරීත්වය අනුව පාලන කටයුතු කිරීම යි.

(3) නීතියේ උත්තරීතරභාවයට අනුව පාලන කටයුතු සිදු කිරීම යි.

(4) සමාජීය සම්ප්‍රදායන්ට අනුව පාලන කටයුතු සිදු කිරීම යි.

12. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරෙන් ලාංකිකයන්ට දේශපාලන ක්‍රියාවලීන්ට සම්බන්ධ වීමට වැඩි අවස්ථාවක් උදා වූයේ පහත සඳහන් කවර ප්‍රතිසංස්කරණය මගින් ද?

(1) 1833 - කෝල්බෲක් - කැමරන් (2) 1910 - කෲව් මැකලම්

(3) 1921- මැනිං (4) 1931 - ඩොනමෝර්

13. පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

(1) ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය යි.

(2) කථානායකවරයා ඇතුළු ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම යි.

(3) අගමැතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය යි.

(4) ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා යි.

14. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව ළමයෙකු ලෙස සැලකෙන වයස් සීමාව කුමක් ද?

(1) අවුරුදු 03ට අඩු (2) අවුරුදු 05ට අඩු

(3) අවුරුදු 12ට අඩු (4) අවුරුදු 18ට අඩු

15. රටක යහපාලනය බිඳවැටීමට හේතුවක් **නොවන්නේ,**

(1) නිලධාරිවාදය යි.

(2) අල්ලස හා දූෂණ ඉහළ යෑම යි.

(3) රාජ්‍ය සේවය දේශපාලනීකරණය නොවීම යි.

(4) රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොර වීම යි.

16. පරිසරය සම්බන්ධයෙන් පුරවැසියෙකු සතු යුතුකමක් වන්නේ,

(1) පරිභෝජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් භාවිත කිරීම යි.

(2) තම අභිමතය පරිදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම යි.

(3) පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම යි.

(4) සිය අවශ්‍යතා හා වුවමනා වැඩි කර ගැනීම යි.

17. සංවර්ධනය මැනීමේ පරමාර්ථයක් **නොවන්නේ,**

(1) ගැටලු අවබෝධ කර ගැනීම ය. (2) ආර්ථික ප්‍රතිපත්ති සකස් කර ගැනීම ය.

(3) රටවල් සමඟ සන්සන්දනය කිරීම ය. (4) ගැටලු සඟවා ගැනීම ය.

18. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ සිටින ස්ථාවර සාමාජිකයින් පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) ඉන්දියාව, ජපානය, ප්‍රංශය (2) ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, චීනය

(3) ප්‍රංශය, ජපානය, ජර්මනිය (4) රුසියාව, ජර්මනිය, ප්‍රංශය

19. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධකයක් වන්නේ මින් කුමක් ද?

(1) අපරාධ ක්‍රියා බහුල වීම (2) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා

(3) ආගම හා රාජ්‍ය බැඳී පැවතීම (4) නිදහස් ජනමාධ්‍ය පැවතීම

20. ක්‍රියාත්මක කරන ආකාරය අනුව නීතිය බෙදෙන ප්‍රධාන කොටස් **දෙක** මොනවාද?

(1) සිවිල් නීතිය හා අපරාධ නීතිය (2) මූලික නීතිය හා සිවිල් නීතිය

(3) දේශීය නීතිය හා අපරාධ නීතිය (4) දේශීය නීතිය හා අන්තර්ජාතික නීතිය

21. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ 'ව්‍යවස්ථාදායකය' මින් කුමක් ද?

(1) ව්‍යවස්ථාදායක සභාව (2) ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව

(3) රාජ්‍ය මන්ත්‍රණ සභාව (4) ජාතික රාජ්‍ය සභාව

22. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධකයකි, සංක්‍රමණ. මේ සඳහා නිදසුනකි.

(1) විජය ඇතුළු පිරිස පැමිණීම (2) කාලිංග මාඝ ආක්‍රමණය

(3) ද්‍රවිඩ ශ්‍රමිකයින් ගෙන්වීම (4) අරාබි ජාතීන්ගේ පැමිණීම

23. ද්වි පක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ඉන්දියාව හා ශ්‍රී ලංකාව (2) උතුරු කොරියාව හා ශ්‍රී ලංකාව
(3) උතුරු කොරියාව හා චීනය (4) ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය

24. ජාත්‍යන්තර වෙළඳාම තුළ භාවිත කරන ප්‍රධාන මුදල් වර්ග ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඇමරිකානු ඩොලර්, ඉන්දියානු රුපියල්, ජපන් යෙන්
(2) බ්‍රිතාන්‍ය ස්ටර්ලිං පවුම්, ප්‍රංශ ෆ්‍රෑන්ක්, යුරෝ
(3) ඇමරිකානු ඩොලර්, බ්‍රිතාන්‍ය ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්
(4) සිංගප්පූරු ඩොලර්, ඉන්දියානු රුපියල්, ශ්‍රී ලංකා රුපියල්

25. රාජ්‍යය සතු ස්වාධිපති බලය බෙදා හැර ඇති ආකාරය අනුව රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙකක් පවතී. අදාළ පිළිතුර තෝරන්න.
(1) ජනාධිපති හා පාර්ලිමේන්තු (2) ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී නොවන
(3) ඒකීය හා සන්ධීය (4) ඒකීය හා ඒකීය මධ්‍යගත

26. බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන්,
(1) ආගමික ගැටුම් වර්ධනය වේ. (2) ජන වර්ග අතර විශ්වාසය තහවුරු වේ.
(3) දේශපාලන ප්‍රශ්න පැන නැගේ. (4) සංවර්ධනය අඩාල වේ.

27. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහළ ම අධිකරණය කුමක් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) දිසා අධිකරණය
(3) අභියාචනාධිකරණය (4) රාජාධිකරණය

28. ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන ජනාධිපතිවරයාගේ නියෝජිතයා වන්නේ,
(1) ආණ්ඩුකාරවරයා ය. (2) ප්‍රධාන අමාත්‍යවරයා ය.
(3) නගරාධිපතිවරයා ය. (4) ඔම්බුඩ්ස්මන්වරයා ය.

29. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්මට බාධාකාරී වන කාරණයක් වන්නේ මින් කුමක් ද?
(1) අන්‍ය සියලු සංස්කෘතීන්ට ඉතා හොඳින් ගරු කිරීම
(2) ජාති, ආගම් හා සියලු භේද නොසලකා කටයුතු කිරීම
(3) අන්‍ය ජාතීන්ගේ භාෂා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
(4) අන්‍ය සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය උසස් කොට සැලකීම

30. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදු කරනු ලබන්නේ,
(1) මානව හිමිකම් කොමිෂන් සභාව යි. (2) සීමා නිර්ණය කොමිෂන් සභාව යි.
(3) අධිකරණ සේවා කොමිෂන් සභාව යි. (4) රාජ්‍ය සේවා කොමිෂන් සභාව යි.

31. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති **සෘණාත්මක** බලපෑමක් වන්නේ මින් කුමක් ද?

(1) විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
(2) කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇති වීම
(3) ගෙවුම්ශේෂ තත්ත්වය යහපත් වීම
(4) සංවර්ධිත රටවලින් එල්ල වන බලපෑම ඉහළ යෑම

32. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු විසින් වර්ධනය කර ගත යුතු පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ආත්මාවබෝධය, සංවේදීතාව, ආවේගශීලී චින්තනය
(2) සවන් දීම, ඵලදායී සන්නිවේදනය, ආවේගශීලී චින්තනය
(3) ආත්මාවබෝධය, ඵලදායී තීරණ ගැනීම, නිර්මාණාත්මක චින්තනය
(4) සහානුභූතිය, නො ඉවසීම, පරිත්‍යාගශීලී බව

33. තිරසර සංවර්ධනය ළඟාකර ගැනීමේ දී වැදගත් වන සමාජීය අවශ්‍යතා පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A. සමාජ සහභාගිත්වය
B. වෙළඳපොළ පුළුල් වීම නිසා ඇති වන තරග පාලනය
C. සාධාරණත්වය ඉටු කර ගැනීම
D. මූලික මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම
E. මිහිමතට දැරිය හැකි සංවර්ධනය

(1) ABC (2) ACD (3) BDE (4) CDE

34. සාර්ක් සාමාජික රටවල් අතර ඇති කර ගෙන තිබෙන ගිවිසුමක් වන්නේ මින් කුමක් ද?

(1) ඉන්දු - ලංකා ගිවිසුම (2) දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම
(3) වෙස්ට් ෆේලියා සාම සම්මුතිය (4) මොන්ට්වීඩියෝ සාම සම්මුතිය

35. ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකය හඳුන්වන නම කුමක් ද?

(1) පාර්ලිමේන්තුව (2) සන්ධීය මහා මණ්ඩලය
(3) කොංග්‍රස් මණ්ඩලය (4) ජාතික රාජ්‍ය සභාව

36. වී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා පොහොර,

(1) පාරිභෝගික භාණ්ඩකි. (2) ප්‍රාග්ධන භාණ්ඩයකි.
(3) සුබෝපභෝගී භාණ්ඩයකි. (4) අන්තර් භාණ්ඩයකි.

37. ධනවාදී ආර්ථික ක්‍රමයක දක්නට ඇති ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) ලාභ චේතනාවෙන් කටයුතු කිරීම (2) දේපළ අයිතිය රජය සතුවීම
(3) තරඟකාරී නොවන වෙළඳපොළ (4) සැලසුම් මණ්ඩලයක් මගින් තීරණ ගැනීම

38. සිඩෝ සම්මුතිය (CEDAW) සම්මත කරන ලද්දේ කුමක් සඳහා ද?

(1) ආදිවාසීන් සුරැකීමට ය. (2) ආබාධිත පුද්ගලයන් සඳහා ය.

(3) කාන්තා අයිතිවාසිකම් සුරැකීමට ය. (4) ළමා ආරක්ෂණය සඳහා ය.

❖ පහත සඳහන් සිදුවීම් පදනම් කර ගෙන, 39 සහ 40 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ක්‍රි.ව. 1215 - බ්‍රිතාන්‍ය මැග්නා කාර්ටා ගිවිසුම

B. ක්‍රි.ව. 1776 - ඇමරිකානු නිදහස් ප්‍රකාශනය

C. ක්‍රි.ව. 1789 - පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය

D. ක්‍රි.ව. 1914 - පළමු ලෝක සංග්‍රාමය

E. ක්‍රි.ව. 1939 - දෙවන ලෝක සංග්‍රාමය

F. ක්‍රි.ව. 1945 - හිරෝෂිමා නගරයට බෝම්බ හෙළීම

G. ක්‍රි.ව. 1948 - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

H. ක්‍රි.ව. 2012 - රුවන්ඩාවේ ගෝත්‍රික ගැටුම් වර්ධනය වීම

39. මානව අයිතිවාසිකම් බිහිසුණු ලෙස කඩවුණු අවස්ථා පමණක් දක්වා ඇති කාණ්ඩය තෝරන්න.

(1) ABDG (2) BEGH (3) DEFH (4) DEGH

40. මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ABCG (2) BCDE (3) DEGH (4) EFGH

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| **குடிமை கல்வி** | **I, II** |
| **Civic Education** | **I, II** |

**පුරවැසි අධ්‍යාපනය II**

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප **දෙක** සඳහන් කරන්න.
   (ii) නීතියේ මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න.
   (iii) 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය මගින් ස්ථාපිත ව්‍යවස්ථාදායක සභාවේ සිටි සභිකයින් **දෙවර්ගය** නම් කරන්න.
   (iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු ගත කර ඇති බලතලවලින් **දෙකක්** නම් කරන්න.
   (v) බලයේ විවිධ ස්වරූපයන්ගෙන් **දෙකක්** නම් කරන්න.
   (vi) 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක වූ නියෝජන ක්‍රම **දෙක** පිළිවෙළින් ලියන්න.
   (vii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පදනම් කර ගත් මූලධර්ම **දෙකක්** ලියන්න.
   (viii) ප්‍රාග්ධන භාණ්ඩ හෙවත් ආයෝජන භාණ්ඩ සඳහා නිදසුන් **දෙකක්** සපයන්න.
   (ix) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප **දෙක** කවරේ ද?
   (x) ශ්‍රී ලාංකීය බහු සංස්කෘතික ජන සමාජය තුළ වෙසෙන ජන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02×10= 20)

2. ඕනෑ ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක උත්තරීතර නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යි.
   (i) විධායක බලය පදනම් කර ගෙන නූතන රාජ්‍යයන් හි ක්‍රියාත්මක වන ප්‍රධාන ආණ්ඩුක්‍රම දෙක සඳහන් කරන්න. (ලකුණු 02)
   (ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගත විය යුතු කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03)
   (iii) (a) ආණ්ඩුවේ ප්‍රධාන ආයතන **තුන** සඳහන් කරන්න. (ලකුණු 03)
   (b) ඉහත (a) හි සඳහන් කළ **එක්** ආයතනයක් සතු බලතල හා කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

3. බහු සංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක ඇති අවශ්‍යතාව වර්තමානයේ දැඩි ව පවතී.

(i) යහපාලනයක දක්නට ලැබෙන මූලික ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වාසි **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(b) ඉහත (a) හි සඳහන් **එක්** ප්‍රයෝජනයක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

4. පුද්ගල අරමුණු, අභිලාෂ හා අවශ්‍යතාවන්ගේ පවතින විවිධත්වය නිසා ගැටුම් වර්ධනය වේ.

(i) ජොහාන් ගැල්ටුන් සඳහන් කරන පරිදි ගැටුමක් ඇති වීමට බලපාන මූලික හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත හැකි ක්‍රමවේද **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ගැටුම් සාමකාමී ව නිරාකරණය කර ගැනීමෙන් අත් වන වාසි **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(b) ඉහත (a) හි සඳහන් **එක්** වාසියක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

5. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විකාශනය රාජාණ්ඩු සමය දක්වා දිව යයි.

(i) ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් අධිකරණ බලතල සහිත ව පිහිටුවා ඇති විනිශ්චය අධිකාරී ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳ ව ඉහළ ම තලයේ සිටින ප්‍රධාන භූමිකා **තුන** නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) නීතියේ ආධිපත්‍යය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(b) ඉහත (a) හි සඳහන් කළ **එක්** ලක්ෂණයක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

6. පරිසරයට මිනිසාගෙන් තොර ව ජීවත් විය හැකි ය. එහෙත් මිනිසාට පරිසරයෙන් තොර ව ජීවත් විය නොහැකි ය.

(i) පරිසරය සකස් වී ඇති ප්‍රධාන සංරචක **දෙක** කුමක් ද? (ලකුණු 02)

(ii) පරිසරයෙන් ලැබෙන ප්‍රධාන සේවා **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) වන හායනය නිසා ඇති වී තිබෙන අහිතකර ප්‍රතිඵල **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(b) වන හායනය අවම කර ගත හැකි **ක්‍රමවේදයක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

7. නූතන ලෝකයේ කිසිදු රාජ්‍යයකට තනි ව ජීවත් විය නොහැකි ය.

(i) අන්තර්ජාතික වෙළඳාම සිදු වන ප්‍රධාන ආකාර **දෙක** දක්වන්න. (ලකුණු 02)

(ii) විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවට විදේශ ආධාර සපයන රටවල් **තුනකට** නිදසුන් සපයන්න. (ලකුණු 03)

(b) විදේශ ආධාර ලැබීම තුළින් ශ්‍රී ලංකාවට අත් වන වාසිදායක **තත්ත්වයක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

*****